# අපේ උරුමය හා පරිසර සංරක්ෂණය

විවිධ භෝග වර්ග වගාකිරීමට සුදුසු සාරවත් පසක් සහ ජලය පැවති ප්‍රදේශයක් ආශ්‍රය කොට ගෙන, මුල්කාලීන සිංහල ජනාවාසයන් ඇති වී තිබෙන බව, ඒ ජනාවාස පිහිටි ස්ථාන අධ්‍යයනයකින් හෙළි වේ. ක්‍රි.පූ. 6–5 සියවස් වලදී පටන් ම, කලින් කල විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ වයඹ හා ගිණිකොන වෙරළ බඩ ප්‍රදේශ වලට ජන සංක්‍රමන සිදු වූ බවට සාක්ෂි ඇත. එහෙත් ශ්‍රී ලංකාවේ දනට සොයාගෙන ඇති පැරණිතම සෙල්ලිපිය ක්‍රි.පූ. 3 වැනි සියවසට අයත් වේ. මෙයට පෙරාතුව පවා මෙරට ජනාවාසයන් පවතින්නට ඇති බව ඒ අනුව පෙනේ. සෙල්ලිපි පිහිටි ස්ථාන පැරණි ජනාවාස පැවතුන ස්ථාන හෝ ඒ ආසන්න ස්ථාන හෝ හැටියට සැළකුව හොත්, සෙල්ලිපි වල අවකාශිය ව්‍යාප්ත රටාව එකල ජනාවාස රටාව පිළිබිඹු කෙරේ යැයි සිතිය හැක.

මුල් කාලීන බ්‍රාහ්මී සෙල්ලිපි පිහිටි ස්ථානවල අවකාශිය රටාව අනුව හෙළි වන්නේ ක්‍රි.පූ. 3 සහ 2 සියවස්වල දී පැරණි සිංහලයන් මුළු දිවයිනම ගවේශණය කර ඇති බවයි. සී. ආර්. පානබොක්කේ ශ්‍රී ලංකාවේ පාංශු අධ්‍යයනයේදී පෙන්වා ඇති පරිදි, වියළි කලාපයේ පිහිටි රතු දුඹුරු සහ එහි ජල වහන ආශ්‍රිත පස් වර්ගය, මේ රටේ තිබෙන පස් වර්ග වලින් ප්‍රධානතම වර්ගය වන්නේ, ව්‍යාප්ත ප්‍රමාණය අනුවත්, වියලි කලාපයේ වෙනත් පස් වර්ග හා සසඳන විට ඉතාමත් සරුසාර පස් වර්ගය වන නිසාත්ය. වියලි කලාපයේ භූ විෂමතාවට අනුකූලව සකස් වී ඇති ජලවහන තත්ත්වයන් අනුව රතු දුඹුරු පස තත්ත්වයන් අනුව රඳ ඇත. වියලි කලාපීය ගැමියා කෘෂිකාර්මික කටයුතුවලට යොදා ගන්නා බිම් දෙස, විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් බැලුවහොත් පෙනී යන්නේ, පාරම්පරික අත් දැකීම් අනුව ඔහුගේ භෝග වර්ගවලට බිම් තෝරා ගෙන ඇත්තේ රතු දුඹුරු පසේ ජල වහනයට අනුකූලව යයි සිතිය හැක.

මනා ජලවහනයක් ඇති පස් කලාපය ගොඩ භෝග වලටත් අසම්පූර්ණ ජලවහනයක් සහිත පස් කලාප වී හේන් සඳහාත්, දුර්වල ජලවහන සහිත පස් කලාපය වෙල්යාය සඳහාත් යොදගෙන ඇති බවය. පස සහ පසේ ව්‍යාප්තිය අධ්‍යයනීන් තොරතුරු රාශියක්, ලබාගත හැක. එමෙන්ම මිනිසා පස පරිහරණය කර ඇති ආකාරයත්, පසේ ලක්ෂණය අනුව මනුෂ්‍ය කටයුතු නියම වී ඇති ආකාරයත් එමගින් අධ්‍යයන කළ හැක. රතු දුඹුරු පස් වර්ගය විශේෂයෙන් ව්‍යාප්ත වී ඇත්තේ අනුරාධපුර, පොළොන්නරුව, හම්බන්තොට, වැනි දිස්ත්‍රික්කවලත්, මොනරාගල, ත්‍රිකුණාමලය වැනි දිස්ත්‍රික්ක වල කොටස් කළ හැක. එනම්, මනා ජලවහනයක් ඇති පස, අසම්පූර්ණ ජලවහනයක් ඇති පස සහ දුර්වල ජලවහනයක් ඇති පස යනුවෙනි. කෘෂික බෝගයන්ගේ පාරිසරික අනුවර්තිත අන්තරයන් ජලවහන සමහර කොටස් වලත්ය. මේ පස් වර්ධනය වී ඇත්තේ ප්‍රාකේම්බ්‍රියන් යුගයට අයත් මව් පාෂාණයන් දිරාපත් වීමෙන් ඇතිවී තිබෙන අපාරගම්‍ය ස්ථර වලින් යුත් රැලිබිම්ප්‍රදේශවලය. පෞරාණික භූතල වාරිමාර්ග රටාව ගොඩ නැගී ඇත්තේ මෙවැනි බිම් වලය. වැව් වලින් ජලසම්පාදනය කෙරුණේ ප්‍රධානවශයෙන්, පාරගම්‍යතාවෙන් අඩු නිම්නවල පිහිටි, ආර්ද්‍ර මැටි පස් කලාපවලටය. වැව්වල සිට ජලය රැගෙන යන ප්‍රධාන ඇල මාර්ග ඉදිකොට ඇත්තේ ද භූමියේ පහත කොටස් වලය.

සම භූමියකින් යුක්ත මන්නාරම් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති නිසරු ග්‍රැමසෝල් හෙවත් නිවර්තන කලු මැටි පස් වර්ගය සහ වෙනස් වන සුලු වහනයකින් යුක්ත ක්ෂාරීය ලවන පස් හෙවත් සොලඩයිස් සොලනෙට්ස් සහ සෝලන්චෙක් පස්, ආහාර, වගාකිරීමට නුසුදුසුය.

මේ නිසා මෙහි වාරිමාර්ග වර්ධනය වී ඇත්තේ සුලු වශයෙනි. නිදසුනක් වශයෙන් යෝද වැවේ ඇල මාර්ග රටාවේ පිහිටිම සලකන විට පෙනීයන්නේ රතු දුඹුරු පස් සහිත උතුරු මැද පලාතේ ඉදිකොට ඇති වැව්වලට වෙනස් බවය. මෙහි ප්‍රධාන හේතු ව වී ඇත්තේ වැව් බැම් ඉදිකිරීමට උපයෝගීවන කලු ගල් උද්ගතයන් නැති වීමත්, ජලය කාන්දු නොවී රැස්කර තැබීමට උපයෝගී වන අපාරගම්‍ය පාෂාන ස්ථරයන් නොතිබීමත්ය. පුත්තලම, මන්නාරම සහයාපනදිස්ත්‍රික්කවලනැතහොත් වයඹ සහ උතුරු ප්‍රදේශයන්හි, පැරණි කාලයේ ජනාවාස පිහිටා තිබුනේ සීමිත ප්‍රදේශවලය. මේ ප්‍රදේශයන්ගේ පස ලැටසෝල්ය, එය සොලඩයිස්සොලනෙට්ස් සහ රතු දුඹුරු පස් කලාපයෙන් අතර පිහිටා ඇති අතර, චතුර්ථික යුගයට අයත් සමුද්‍රක වැලිලෝම නධිනගෙන් ඇති වූ පසෙකි. මේ ලැටසෝල්වල ඇති ලක්ෂණය නම්, මධ්‍යම ප්‍රමාණයේ සිට රළු ප්‍රමාණය දක්වා වෙනස්වන වහනයකින් යුක්ත වීමත්, අධික සවිවරභාවයකින් යුක්ත වීමත්, පහසුවෙන් ජල වහනය වීම නිසාත් භූතල ජලය රැස්කල හැකි වැව් ඉදිකිරීම දුෂ්කර වී ඇත. මේ ප්‍රදේශයේ පසේ මේ ලක්ෂණයන් නිසාම පාංශු ජලය පහසුවෙන් භූගතවී, භූගත ජලාශයන් වශයෙන් පවතී. පැරණි සිංහල සභ්‍යත්වයේ පැවති තාක්ෂණික, දැනුමෙන් මේ ප්‍රදේශයේ ගැඹුරේ පිහිටි ජලය ලබා ගැනීමට අපොහොසත් වූ නිසායි, ජනාවාස සීමා වී තිබුණේ. බ්‍රාහ්මී සෙල්ලිපි සහ පාංශු ව්‍යාප්ති සිතියම් සසඳන විට ලගන්නා සුළු නව



ඉතිහාසයේ සිටම ගොවිතැනෙහි අනිවාර්ය අංගයක් වූයේ සංරක්ෂණයයි

අදහසක් ඇති කෙරෙන අන්‍යොන්‍ය සම්බන්ධතාවක් හෙළිවේ. පැරණි සිංහල සංක්‍රමණිකයන් වැඩි වශයෙන් ගොඩ බටුයේ වයඹ දිග වෙරලබඩ කලාපයටය. මෙහි පස නිසරුය. ප්‍රමාණවත් ජල සැපයුමක් නොමැති විය. කටු පඳුරු සහිත වෘක්ෂලතා ප්‍රජාවකින් යුක්තවන්නට ඇත. මෙහි ජීවත්වීම එක් අතකින් අපහසු වන්නට ඇති නිසා, ඊට වඩා සාරවත් වෘක්ෂලතා ප්‍රජාවකින් මෙන්ම, ප්‍රමාණවත් ජල සැපයුමකින් යුක්තවූ, රතු දුඹුරු පස් කලාපයට සංක්‍රමණය වී ජනාවාස පිහිටුවා ගන්නට පෙළඹී ඇත.

මේ අන්දමට රජරට පිහිටි පළමු විශාල ජනාවාසය පිහිටියේ නුවර කලාවිය හා ඒ අවට ප්‍රදේශයේය. එහි කේන්ද්‍රස්ථානය වශයෙන්, පැවැතියේ අනුරාධපුරයයි. එහෙත් ගිණිකොන වෙරළට ගොඩබට සංක්‍රමණිකයනට මෙවැනි දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු නොවූයේ, වෙරළාසන්නයේම රතු දුඹුරු පස ව්‍යාප්තව තිබුණ නිසාය. මේ ප්‍රදේශයේ පෞරාණික ජනාවාසයන් හැටියට ගතහැකි මහගම, කජරගම (කතරගම) චිත්තලපබ්බත, (සිතුල්පව්ව) වැනි ප්‍රධාන ජනාවාස වෙරලාශ්‍රිතව පිහිටුවා ඇත. පළමුවන සහ දෙවැනි සියවස් වලින් දක්වෙන අන්දමට පැරණි සිංහල රජදවස මෙවැනි ජනාවාසවලින් බොහොමයක් පිහිටියේත්, එකල පැවති තාක්ෂණික දැනුම අනුව වගාකටයුතු පවත්වා ගෙන යාමට හැකි වූයේත්, රතු දුඹුරු පස් කලාපයේ බව පැහැදිලි වේ. ඒ නිසා මේ යුගයේ ජීවත් වූ මිනිසාට මානව අවශ්‍යතාවන් සඳහා උපයෝගී කොට ගතහැකි ස්වාභාවික සම්පත් තෝරා බේරා ගැනීමේ දැනුමක් සහ දක්ෂතාවයක් තිබුණ බව එයින් හෙළිවේ.

භූමියේ ඇතිවූ ජන පීඩනය නිසා, ලැටසෝල් පස් ප්‍රදේශය භූගත ජලය දනට වසර 15 කට ප්‍රථම දී පටන් ප්‍රයෝජනයට ගැනීමට තැත් කොට ඇත. මේ ප්‍රදේශයේ ඇති ළිංවල සාමාන්‍ය ගැඹුරු අඩි 400 ක් පමණ වන අතර ජලය මතුපිටට ලබාගැනීම සඳහා 'සබ් මර්සිව්'' පොම්ප යොදගෙන ඇත. මෙවැනි පොම්ප මගින් ජල සම්පාදනය කෙරෙනුයේ පුත්තලමට, උතුරින් ඇති වනාතවිල්ලු ප්‍රදේශයේය.

කඳුකර ප්‍රදේශයේ ඇති ස්වාභාවික වෘක්ෂලතා වක් වන සවානා නොහොත් තලාව, බිම් විශේෂයෙන් පස්සර, බිබිල, මොනරාගල, ඇකිරියන්කුඹුර සහ කොස්ලන්ද යන ප්‍රදේශවල ව්‍යාප්තව ඇත. (3 වන සිතියම) මේ වර්ගයේ විශේෂ ලක්ෂණය වන්නේ තෘණ වර්ග සහ ගස් වර්ග මිශ්‍රව වැඩීමයි. තෘණ වර්ග අතර ප්‍රධාන වන්නේ, ඉලුක් (ඉම්පරාටා සිලින් ඩ්‍රිකා සහ මානා (සිබ්බෝපෝගන්, කොන්පර්ටීප්ලෝජ්ස්) යන කරවටක් පමණ උසට වැවෙන, රළු තෘණ වර්ගයන්ය. වැවෙන ගස්වල සාමාන්‍ය උස අඩි 12–25 අතර වේ. මෙවැනි ගස්වල කෙටි කඳන්, සහ බොහෝ අතු බොහෝමයක් සමාවෘත හෙවත් ඇදකුද සහිතව ඇත. සාමාන්‍යයෙන් පොත්ත ද ඝන වල්කමය ස්වරූපයකින් යුක්තය. අක්කරයක තිබෙන ගස් සහ පඳුරු ශාඛා සංඛ්‍යාව 50–75 අතර වේ. මෙහි බහුලව වැවෙන ගස් වර්ග නම් අරළු (ටර්මිනාලියා චෙබුලා), බුලු (ටර්මිනාලියාබෙලරිකා), නෙල්ලි (එම්බ්ලිකා ඔෆිසිනාලිස්) සහ ගම්මාලුය (ටෙරොකා පස් මාසුපියම්) වේ. මෙවා බහුල වශයෙන් ආයුර්වේද ඖෂධ වශයෙන් යොද ගන්නා නිසාත්, එකට වැඩි ඇති නිසාත්, පැරණි සිංහල රාජකීය බෙහෙත් වතු යන මිත්‍යා විශ්වාසයක් ප්‍රචලිත වී ඇත. එය සත්‍යයෙන් තොරය. මෙහි බහුලව වැවෙන වෙනත් ගස් වර්ග නම් කුඩුම්බේරිය (ඩියෝස්පිරොස් මෙලනොක්සයිලන්) ය. මේවායේ වායේ ලපටි කොළ වියලා, බීඩි එතීම සඳහා යොද ගනු ලැබේ. සවානා බිම්වල පවත්නා ගස් සහ තෘණ වර්ගවල ඇති සමහර ලක්ෂයන් නම් ගින්නට ඔරොත්තු දීමේ ස්වරූපයයි. තවද, මෙම වෘක්ෂලතා වර්ගයට සංස්කෘතික ඇබ්බැහියක් වශයෙන් කලින් කල කෙරෙන ගිනිතැබීම් ද ඒවායේ පැවැත්මට හිතකර සාධකයක් වී ඇත. නිදසුනක් වශයෙන් කඩුම්බේරිය ගස්වල දලු ලියලීම සිදු වන්නේ ගිනි තැබීමකින් පසුවය.

ඉහතකී අරළු, බුලු, නෙල්ලි, ගම්මාලු වැනි ගස් ඓතිහාසික යුගයේදී මෙරට ගෙන එනු ලැබූ ඒවා වේ. මෙවැනි ශාඛාවලට උද්භිත විද්‍යාඥයින් දේශනාකූල කෘත පරදේශීය වර්ග වශයෙන් හඳුන්වනු ලැබේ. එම ප්‍රකාශ තහවුරු කිරීමට තර්කයක් එන්. පී. පෙරේරා විසින් ඉදිරිපත් කොට ඇත. ඒ අනුව උස්බිම් සවානා බහුලව ඇති නැගෙනහිර ඌව ප්‍රදේශයේ පැවැති පැරණි කෘෂි අර්ථ ක්‍රමයේ යාය, ගෙවතු, හේන සහ වල්පිට යන බිම් වලින් භූමි පරිභෝග රටාව සකස් වී තිබූනත්, අනුරාධපුර, පොළොන්නරු ප්‍රදේශ වල පැවැති ආකාරයට වෙනස් වූයේ මෙහි විශාල වාරි මාර්ග ක්‍රම ඉදි කිරීමට නොහැකි වූ නිසාය. එමෙන්ම කුඩා වැව් වුවද මේ ප්‍රදේශයේ ඉදි කොට ඇත්තේ අල්ප වශයෙනි. පාංශු සිතියමේ (පළමුවන සිතියම) දක්වෙන අන්දමට මෙහි ඇත්තේ රතු දුඹුරු සහ අපරිනිත දුඹුරු ලෝම යන පස් දෙවර්ගයයි.




**ගොවි මහතුනි - වැවිලි කරුවනි!**

ඔබගේ ප්‍රදේශයත් වගාවත් අනුව,
නවීන තාක්ෂණික ක්‍රම යොද අපගේ පර්යේෂණාගාරයේ දී
දක්ෂ පළපුරුදු රසඥයන් විසින් පර්යේෂණ පවත්වා නිෂ්පාදනය කර ඇති,

**සී. සී. සී. පොහොර**

**ශතවර්ෂයකට අධික කාලයක් ගොවීන් හා වැවිලිකරුවන් භාවිතා කර ප්‍රතිඵල ලබා ඇත.**

**තේ, පොල්, රබර්, ධාන්‍ය වර්ග, එළවළු සහ එලතුරු**

ආදී සියළුම වගාවන්වලින් උපරිම අස්වැන්නක් ලැබීමට නම් ඔබත් යොදන්න.

**සී. සී. සී. පොහොර**

මේ හැර ඔබට අවශ්‍ය රසායනාගාර පහසුකම් ද
අප වෙතින් ලබා ගත හැක.

**සියලු විමසීම්:—**

**අලෙවි කළමනාකරු**
**රජයට පවරාගත් කොළඹ කොමාර්ෂල් (පොහොර) සමාගම**
**අංක 25, ලිලී වීදිය**
**තැ. පෙ. 433**
**යුනියන් පෙදෙස – කොළඹ 2.**

දුරකථන: **29551 – 29552**

රළු බිම් සහිත භූ විෂමතාවක් ඇති, මෙහි මධ්‍ය සහ ඉහල බෑවුම් වල සාමාන්‍යයෙන් කෘෂිකර්මයට යෝග්‍ය රතුදුඹුරු පස තිබෙන කලාපයේ පහත් බිම් සෘතුමය වර්ෂාවනාන්තර ව්‍යාප්ත වී ඇත. (අංක 3 සිතියම) මෙ පස සමග මිශ්‍රව විශේෂයෙන් මද බෑවුම් වල ඇත්තේ අපරිනත දුඹුරු පසය. ඒවායේ සවානා ව්‍යාප්තවී ඇති අතර, පහල බෑවුම්වල සහ නිම්නවල ඇති ආර්ද්‍ර පසේ දුර්වල ජලවහන තත්ත්වයන් පවතින නිසා වී වගා කටයුතු වලට යොදගෙන ඇත. අපරිනත දුඹුරු පස් වල ජල ධාරිතා හැකියාව දුර්වල නිසා වගා කටයුතු සඳහා වාරි මාර්ග ජලය සැපයිය යුතුය.

මෙවැනි පස් වර්ගයක් රතුදුඹුරු පස් කලාපයේ මධ්‍යම සහ පහල බෑවුම්වල තිබීම සම්බන්ධ කරුණු සලකා බැලිය යුතුය. මේ ප්‍රදේශයේ පැරණි කාලයේ පටන් වාරිමාර්ග ක්‍රම හිඟ වූ නිසා ආහාර ලබා ගැනීමේදී, වී ගොවිතැනට වඩා හේන් ගොවිතැන කෙරේ වැඩි අවධානයක් යොමු කිරීමට සිදු වී ඇත. වර්තමානයේ වුවද තත්ත්වය මෙසේය. මේ ප්‍රදේශයෙන් ලැබී ඇති සෙල්ලිපි සහ පුරාවිද්‍යාත්මක සාක්ෂිවලට අනුව ජනාවාස සහ වාරි මාර්ග ක්‍රම සුලු වශයෙන් පැවැතියත් සැහෙන ජන සංඛ්‍යාවක් විසූ බව හෙළිවේ. රතු දුඹුරු පස් කලාපයේ මෙන් නොව මේ පස් කලාපයේ පාරිභෝගික අවශ්‍යතා හේන මත රැඳුනි නම්, භූමිනිස් අනුපාතය අනිවාර්යයෙන් විශාල විය යුතුය. මේ අනුව සාමාන්‍යයෙන් වනාන්තර චක්‍රයට අනුව අවුරුද්දක් හෝ දෙකක් පමණ වගා කලායින් පසු අත්හැර දමූ හේන් කළ බිම්, ශාඛ සන්තතික ක්‍රියාවලියේදී පස සාරවත්. වීමට තරම් කාලයක් පුරන්ව නොතබා, කෙටි කාලයකදී නැවත නැවත වගා කටයුතු වලට යොදන්නට ඇත. මෙහි පශ්චාත් ප්‍රතිඵල වශයෙන් පාංශු ඛාදනයෙනුත් පස හායනකින් නොහොත් පෝෂ්‍ය ඛනිජ සහ හියුමස් වැනි පදර්තයන්ගෙන් දුර්වල වීමෙනුත් පසට හානි පැමිණ ඇත. ඒ. ඩබ්. ආර්. ජෝකිම් සහ ජේ. කන්දයියා, හේන් බිම් ආශ්‍රයෙන් කරණු ලැබූ පාංශු පර්යේෂන වලින් දක්වා ඇත්තේ, හේන් වගාව නිසා පසේ ව්‍යුහීය ලක්ෂණ වලට වැඩි හානියක් සිදු නොවීමට නම් අත්හරින හේන් පුරන් වීමට හරිනු ලබන කාලය නියමාකාරයෙන් සම්පූර්ණ විය යුතු බවය. එමෙන්ම පුරන්වීමේ කාලය ගැන නොතකා නැවත නැවතත් කෙටි කාලයක දී හේන් වගා කලොත්, පසේ ව්‍යුහිය ලක්ෂණ වෙනස් වී පසට හානි පැමිණීම අනිවාර්යයෙන් සිදු වන බවය. රතු දුඹුරු පස හායනය වීම හේතු කොට මෙවැනි අපරිනත දුඹුරු පසක් නිර්මානය වී ඇත. රතු දුඹුරු සහ අපරිනත දුඹුරු යන පස් දෙවර්ගයම පෙරෝමැග්නීසියම් අන්තර්ගත මවු පාෂාන දිරාපත් වීමෙනුයි ඇති වී ඇත්තේ.

සාමාන්‍යයෙන් මේ පසේ 'ඒ' මහල නොගැඹුරුය. හොඳම පස් ඇති තැන්වල වුනත්, උඩ මහල හෙවත් ''ඒ'' මහල අඟල් 6–8 දක්වා ගැඹුරකින් යුක්ත වන්නේ කලාතුරකිනි. මැද මහල හෙවත් ''බී'' මහල අඩි දෙකකට වඩා ගැඹුරු නොවන අතර, එහි තිරුවානා තට්ටුවක් ද දක්නට ලැබේ. මෙයට යටින් ඇති ''සී'' මහලේ ඇත්තේ දිරාපත් වූ ආම්ලික නයිස් නැතහොත් කලුගල් පාෂාණ වර්ගයකි. මේ ආකාරයට පසේ තත්ත්වය දුර්වල වීමත් සමගම සෞර කෘමී සහ ගින්නට ඔරොත්තු දෙන සැවානා ගස් ශාඛ හා තෘණ විශේෂ වර්ග මෙවැනි භූමියක ජනපදකර ගැනීම නිසා වනාන්තර විශේෂ වලට වැඩීමට අවකාශ නොදේ. මේ ආකාරයට වනාන්තරය, සවානා බවට පත් වූ විට, හේන් වගාව සඳහා යෙදීම අපහසු වන්නාක් මෙන්ම ප්‍රයෝජනයන් ද නොලැබේ.

ඉහතකී අන්දමට සවානාවල බහුලව වැවෙන ශාඛා විශේෂ වර්ග වන අරළු, බුලු, නෙල්ලි, ගම්මාලු වැනි බෙහෙත් වර්ග, මේ ප්‍රදේශ ජනාවාස වීමත් සමග ගෙවතුවල වගා කරන්නට ඇත. හේන් බිම් වල පස නිසරු වීමත් සමගම මේ වර්ග එවැනි නිසරු බිම්වල පහසුවෙන් ජනපද කර ගන්නට ඇති අතර, එවැනි නොගැඹුරු පස් සහිත නිසරු පසක වනාන්තර විශේෂවලට ජීවත්වීම අපහසු වන්නට ඇත. මේ ආකාරයට මුලින් තිබුනු සාරවත් වනාන්තර සවානා බවට පත් වී ඇත. වර්තමානයේ වුවත් සවානා ඇති ප්‍රදේශ වල හේන් කෙටීම අපහසු වී ඇත්තේ, තිරුවානා අංශු වලින් පූර්ණ මෙවැනි ජල ධාරිතා ශක්තිය අඩු පසක් තිබීම නිසාය. මෙවැනි ප්‍රදේශවල වුවද, දැනට හේන් වගාව කරගෙන යනු ලබන්නේ මූකලාන් ඇති රතු දුඹුරු පස් සහිත ප්‍රදේශවලයි. කෙසේ වෙතත් මෙවැනි වෘක්ෂලතාවක ආර්ථික වටිනා කමක් නො මැතියයි ඉවත ලිය නොහැක. රජය විසින් දුව, එල, කොල හෝ දුම්මල වැනි ද්‍රව්‍ය එක්කාසු කරන්නන්ගෙන් බදු පමණක් නොව දේශීය ඖෂධ වලින් විශාල ප්‍රමාණයක් ලබා ගනී. නිදසුන් වශයෙන් 1970 වන තෙක් දේශීය ඖෂධවලට ආයාත කරනු ලැබූ අරළු, බුලු, නෙල්ලි වලින් දැනට ස්වයං පෝෂිත වී ඇති අතර, 1971 පටන් මෙවැනි

ද්‍රව්‍ය නිර්යාතය සඳහා යොදගෙන ඇත. බිඩි එතීම සඳහා ආයාත කළ කොල වලින් විශාල ප්‍රමාණයක් කඩුම් බේරිය ගස්වල කොලවලින් ලබා ගනී.

1929 දී ශ්‍රී ලංකා රජය විසින් සම්මත කළ වනාන්තර ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වූයේ දේශගුණය, පස සහ ජල සම්පත් වලට වනාන්තරයෙන් ඇති හිත කර බලපෑම් ආරක්ෂා කිරීම සහ දැව සහ ඉන්ධන පිණිස වෙනත් වැදගත් ද්‍රව්‍ය සඳහාත් ඇති ජාතික අවශ්‍යතා අඛන්ඩව ලබා ගැනීමේ තත්ත්වය පවත්වා ගැනීම සඳහාය.

ඉහතකී අරමුණු දෙකින් පළමු අරමුණ අරභයා පමණක් වුවද වනාන්තර සහ වෙනත් ස්වාභාවික වෘක්ෂලතා ඇති කිරීමත්, පවත්වා ගෙන යාමත් ප්‍රමාණවත්ය. වනාන්තරයක වටිනාකම ඉහත කී අරමුණු දෙක යටතේ දක්වුව හොත්, පළමු වන අරමුණේ වටිනාකම දෙවැනි අරමුණේ වටිනාකම් වලට සමාන වුවත්, පෙන්නුම් කිරීම දුෂ්කරය. කෙසේ වෙතත් දේශගුණය කෙරේ වනාන්තරයේ ඇති බලපෑම ගැන සලකන විට, වර්ෂාපතනය කෙරෙහි වනාන්තරයෙන් ඇති බලපෑම කොතෙක් ද යන ප්‍රශ්නය, කෙනෙකු තුල ඇති විය හැක. වනාන්තර තිබෙන ප්‍රදේශයක වර්ෂාපතනයේ ප්‍රමාණය සහ තීර්වතාවය වැඩිවන බව එක ගුරුකුලයක අදහස වේ. එහෙත් කාලගුණ විද්‍යාඥයින් වැනි, වෙනත් අයවලුන් මේ සම්බන්ධව සැක පහල කොට ඇත. කෙසේ වෙතත් ස්මිත් සෝනියන් ආයතනයේ ශ්‍රී ලංකා පරිසර විද්‍යාත්මක ආයතනයේ, පරිසර විද්‍යාත්මක පර්යේෂණ යෙන් හෙළි වී ඇති කරුණු අනුව ඩී. මුලර් ඩුම්බුවා මෙසේ පෙන්වාදී ඇත. හෝර්ටන් තැන්නේ දෛනික වර්ෂා පතන විශ්ලේෂණ අනුව, මාර්තු සහ අප්‍රේල් මාස වල වනන්තරය තුළ තිබූ වර්ෂා පතන මානක වල සටහන් වූ ජල ප්‍රමාණය, එම මාසය තුළ, එයට ආසන්න පතන් බිම් වල වර්ෂා පතන මානක වල සටහන් වූ ජලය ප්‍රමාණයට වඩා වැඩිය. මැයි මාස යේ දී මේ මානකයන්හි එක සමාන වර්ෂා ප්‍රමාණයක් වාර්තා වී තිබේ. එහෙත් ජූනි, ජූලි මාසවල පතන් වල තිබුණු වර්ෂා මානකවල වාර්තා වූ ප්‍රමාණය, වනාන්තරය තුළ වාර්තා වූ ප්‍රමාණයට වඩා වැඩිය. මේ අනුව හෙළි වී ඇත්තේ, මාර්තු, අප්‍රේල් මාසවල අඩි 7,000 පමණ උන්නතාංශ දක්වන හෝර්ටන් තැන්න හරහා විහිදෙන වලාකුළු වලින් එම කාලයේ වැඩි වර්ෂාවක් ඇති කෙරෙන බවයි.

කෙසේ වෙතත්, මේ මාස දෙකේ දී පවතින අධිසංතෘප්ත වාතය නිසා වනාන්තරයේ ශාඛ පත්‍රවල ජල බිඳිති රොක්වන අතර, ඒවා පසට එක් වේ. නිරිත දිග මෝසමට පූර්ව මාස දෙක වන අප්‍රේල් මාර්තු, සාපේක්ෂ වශයෙන් වියලිය. මේ කාලය තුළ දී වනාන්තර පසට, පතන්වල පසට වඩා අක්කරයකට ජල ගැලුම් 120-100,000 දක්වා ප්‍රමාණයක් ලැබේ. එහෙත් නිරිතදිග මෝසම් කාලයේදී ජලය බහුලව ලැබෙන ජූනි, ජූලි මාසවල වනාන්තර පසට ලැබෙන ජල ප්‍රමාණය අඩු බව හෙළි වී ඇත. මේ කාලයේ ක්ෂණිකව කෙටි කාලයක් තුළ කඩා හැලෙන අධික වර්ෂාපතනයකින් පසු දීප්තිමත් ආලෝකය පවතින නිසා වනාන්තරයට ලැබෙන ජල ප්‍රමාණයෙන් වැඩි කොටසක් වනවියනින් වාෂ්පීකරණය වේ. හෝර්ටන් තැන්නේ ඇති කඳුකර වර්ෂා වනාන්තරයේ ඇති වැදගත්කම, සලකන විට පෙනී යන්නේ, මේ ප්‍රදේශයෙන් උපත ලබන මහවැලි හා වලවේ ගංගා දෙකේ මව් දියතු වලට ලැබෙන ජල ප්‍රමාණය නොකඩවා පවත්වා ගෙන යාමට හැකි වීමයි. ශ්‍රී ලංකාවේ වාරිමාර්ග ජලයෙන් වැඩි ප්‍රමාණයක් ලබා ගන්නේ මේ ගංගා දෙකිනි. වනාන්තර වලින් ලැබෙන ප්‍රයෝජන සලකන විට පාංශු ජලයට එක්වන ජල ප්‍රමාණය කෙළින්ම වර්ෂාපතනයෙන් ලැබෙන ජල ප්‍රමාණයට වඩා බෙහෙවින් ම වැදගත්ය. අධික වර්ෂාපතනයකින් ක්ෂණිකව ලැබෙන ජල ප්‍රමාණයෙන් විශාල කොටසක්, පාංශු ජලයට එක් නොවී, අතිරික්ත ගලායාම මගින් නැති වීමත්, පාංශු ඛාදනය සිදුවීමත් නිසා, පසට ඇති විය හැකි ජල විද්‍යාත්මක නිරුද කත්වය සලකන විට, හෝර්ටන් තැන්නේ වියලි කාලයේදී ඇති වන මීදුමෙන් ලැබෙන පිනිබිඳිති අපතේ යාමකින් තොරව, පාංශු ජලයට එක්වන බවක් සැලකිය හැක.

ශ්‍රී ලංකාවේ මුළු බිම් ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් ගත් විට අඩි 5,000 ට වඩා උස් ප්‍රදේශයේ ඇත්තේ අල්ප වනාන්තර ප්‍රමාණයකි. එයිනුත් විශාල කොටසක් (හෝර්ටන් තැන්න, මුන් තැන්න, එල්ක් තැන්න වැනි ප්‍රදේශවල පැවති වන බිම්) හෙළි කොට ඇත.

පාංශු ඛාදනයෙන් සහ වර්ෂා පතනයෙන් ලැබෙන ජලය ක්ෂණිකව (අතිරික්ත ගලායාම මගින් සිදුවන) නැතිවීම වැලැක්වීම පිණිස ඝනව වැඩුනු වෘක්ෂ ලතාවරණයක් සහ දිරාපත් වූ ශාඛ ආවරණයක් තිබිය යුතුය. එවැනි තත්ත්වයක් නොතිබුණහොත් වැහි බිඳිති වල තද බලපෑම ඍජු වශයෙන් පසට ලැබේ.